සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - I

**13 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

__උපදෙස් :__

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ.
- I කොටසට ඇතුළත් බහුවරණ ප්‍රශ්න 30 සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- II කොටස හා I කොටස පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

## I කොටස

(01) ශ්‍රී ලංකාවේ මෙට්‍රික් සිතියමක භූමියේ 10km ක් දිග ප්‍රදේශයක් නිරූපණය වන ප්‍රමාණය මින් කුමක් ද?

(1) 10cm (2) 20cm (3) 5cm (4) 2cm (......)

(02) භූ ලක්ෂණ සිතියමක පවතින භෞතික ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර මින් කවරක් ද?

(1) දිය ඇල, වැව, ගංගාව, කොත්කන්ද (2) කොත්කන්ද, වාරි ඇළ, ගංගාව, රැළිබිම
(3) කොත්කන්ද, සානුව, රැළිබිම, තැනිතලාව (4) සානුව, තීර්යක් නිම්නය, ගංගාව, දිය ඇල (......)

(03) 1 : 50,000 සිතියමක් දෙගුණයකින් විශාල කල විට එම සිතියමෙහි නියෝජ්‍ය පරිමාණ භාගය වන්නේ මින් කවරක් ද?

(1) 1 : 5,000 (2) 1 : 100,000 (3) 1 : 10,000 (4) 1 : 25,000 (......)

(04) සරළ රේඛීය ප්‍රස්ථාරයක් ලෙස සැලකිය හැක්කේ මින් කවර ප්‍රස්ථාරයද?




(......)

(05) කිසියම් අධ්‍යයනයක් සඳහා තෝරා ගන්නා දත්ත රැස්කිරීමට අවශ්‍ය සංගහනය විශාල වන විට සිදු කළ යුතු වන්නේ මින් කවර කාර්යයක් ද?

(1) නියැදියක් තෝරා ගැනීම. (2) සංගහනය අඩු කර ගැනීම.
(3) ඍජු නිරීක්ෂණයක් කිරීම. (4) සාකච්ඡා මගින් දත්ත ලබා ගැනීම. (......)

(06) කිසියම් දත්ත රැස් කිරීමක් සඳහා අන්තර්ජාල සෙවුම් යන්ත්‍ර භාවිතා කරන්නේ,

(1) කාලගුණික දත්ත ලබා ගැනීම සඳහායි.
(2) පුළුල් පරාසයක තොරතුරු ලබා ගැනීම සඳහායි.
(3) ප්‍රකාශයට පත්නොකළ තොරතුරු ලබා ගැනීම සඳහායි.
(4) ක්‍රමික පිළිවෙලකට දත්ත ලබා ගැනීම සඳහායි. (......)

(07) කිසියම් දත්ත ව්‍යාප්තියක දත්ත සුළු ගණනක් ඇතිවිට මධ්‍යන්‍යය සෙවීමේදී භාවිතා කළ හැකි සූත්‍රය මින් කුමක් ද?

(1) $\frac{\varepsilon fx}{n}$ (2) $\frac{\varepsilon fxn}{n}$ (3) $\frac{\varepsilon x}{n}$ (4) $\frac{(\varepsilon fd)c}{n}$ (......)

(08) පෘථිවි වායුගෝලය, මතුපිට තලය හා භූ අභ්‍යන්තරය යන ස්ථර පිළිබඳ සංවේදනය කරන ලද තොරතුරු නිවැරදිව ලබා ගත හැකිවන්නේ මින් කවර දත්ත මූලාශ්‍රයෙන් ද?

(1) ගුවන් ඡායාරූප (2) සිතියම් (3) දත්ත වගුව (4) චන්ද්‍රිකා ප්‍රතිබිම්භ (......)

(09) යම් ස්ථානයක අක්ෂාංශ හා දේශාංශ ගත පිහිටීම වඩාත් නිවැරදිව පෙන්වන තාක්ෂණික ශිල්ප ක්‍රමය මින් කුමක් ද?

(1) චන්ද්‍රිකා ප්‍රතිබිම්භ. (2) භූගෝලීය තොරතුරු පද්ධති.

(3) භූගෝලීය විසරණ පද්ධති. (4) ගෝලීය ස්ථානීය පිහිටුම් පද්ධති. (......)

(10) GIS පරිගණක ආධාරයෙන් සිතියම් නිර්මාණය සඳහා භාවිතා වන දෛශික සිතියම් වර්ග දෙක වන්නේ,

(1) තේමා සිතියම් හා ගුවන් ඡායාරූප වේ. (2) මුද්‍රිත සිතියම් හා හස්තික සිතියම් වේ.

(3) මෙට්‍රික් සිතියම් හා දේශගුණ සිතියම් වේ. (4) පාංශු සිතියම් හා දේශගුණ සිතියම් වේ. (......)

(11) ග්‍රැනයිට් හා ඔබ්සීඩියන් වැනි ආග්නේය පාෂාණ අඩංගු සිලිකා ප්‍රතිශතය අනුව වර්ග කළ විට අයත් වන්නේ මින් කුමන වර්ගයටද?

(1) අම්ල ආග්නේය පාෂාණ. (2) භාෂ්මික ආග්නේය පාෂාණ.

(3) ආන්තර ආග්නේය පාෂාණ. (4) පාර භාෂ්මික ආග්නේය පාෂාණ. (......)

(12) පෘථිවි කබොල්ලේ ඇති ඛනිජ වලින් 95% ක් ම පවතින්නේ මින් කුමන ඛනිජ වර්ගයද?

(1) සල්ෆේට් (2) ඔක්සයිඩ් (3) කාබනේට් (4) සිලිකේට් (......)

(13) පෘථිවි ශිලා ගෝලය අළුතින් නිර්මාණය වනු දැකිය හැක්කේ මින් කවර තැටි මායිම් ආශ්‍රිතවද?

(1) අභිසාරී තැටි මායිම (2) අපසාරී තැටි මායිම

(3) තීර්යක් තැටි මායිම (4) පරිවර්තන තැටි මායිම (......)

(14) රූප සටහනේ දක්වෙන පරිදි යමහල් විදාරණය සිදුවන යමහල් වර්ගය වන්නේ,



(1) විසූවියස් වර්ගය

(2) ප්ලීයන් වර්ගය

(3) ප්ලීනියන් වර්ගය

(4) හවායි වර්ගය (......)

(15) ගංගාවක යෞවන අවධියේ දී නිර්මාණය විය හැකි භූ රූප කාණ්ඩය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගංගා විලෝපය, ගල්වන, ගැඹුරු නිම්න. (2) දිය ඇලි, ගං දඹ, ගැඹුරු නිම්න.

(3) ගැඹුරු නිම්න, ගං කණ්ඩි, පිටාර තැන්න. (4) පටු V හැඩ නිම්න, ගං දඹ, ගං කණ්ඩි. (......)

The National e-learning Portal for The General Education

(16) සුළඟ මඟින් ගෙන යන භාරය ඉදිරියේ ඇති පාෂාණ ස්කන්ධවල හැපීමෙන් සිදුවන ඛාදනය හඳුන්වනු ලබන්නේ,

(1) අපහරණය ලෙසිනි. (2) උල්ලේඛය ලෙසිනි.

(3) ඝර්ෂණය ලෙසිනි. (4) සංඝර්ෂණය ලෙසිනි. (......)

(17) පහත රූප සටහනේ දැක්වෙන්නේ සම පීඩන රේඛා ඇසුරින් දක්වනු ලබන දේශගුණික සංසිද්ධීන් දෙකකි. ඒවා දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,




(a)




(b)

(1) සුළං නිර්මාණය වන ස්ථාන දෙකකි.

(2) උෂ්ණත්වය පෙන්වනු ලබන සටහන් දෙකකි.

(3) වාසුලි හා පිළි වාසුලි ඇතිවිය හැකි අවස්ථා දෙකකි.

(4) මීදුම හා තුහින ඇතිවිය හැකි අවස්ථා දෙකකි. (......)




(18) දී ඇති ලංකා සිතියමෙන් දැක්වෙන වර්ෂාපතන රටාව අනුව ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ක්‍රමය වන්නේ,

(1) නිරිත දිග මෝසම් වේ.

(2) ඊසාන දිග මෝසම් වේ.

(3) සංවහන වේ.

(4) වාසුලි වේ. (......)

(19) ලෝක ජල ව්‍යාප්තිය ගත් විට වායුගෝලයේ පමණක් පවතින ජල ප්‍රමාණය අඩංගු පිළිතුර මින් කුමක් ද?

(1) 0.001 කි. (2) 0.01 කි. (3) 1.0 කි. (4) 0.10 කි. (......)

(20)
- දැඩි කටුක ගිම්හානයක් ඇත.
- කුඩා පත්‍ර සහිත ශුෂ්කරූපී ශාක ඇත.
- ශාක වල දිගු මුල් ඇත.
- වාර්ෂික වර්ෂාපතනය 762mm ට අඩුය.

ඉහත දැක්වෙන ලක්ෂණ අඩංගු බියෝම වර්ගය මින් කුමක් ද?

(1) නිවර්තන මෝසම් වනාන්තර. (2) සෞම්‍ය කලාපීය වනාන්තර.

(3) මධ්‍යධරණී වනාන්තර. (4) ටයිගා වනාන්තර. (......)

(21) ලෝක ජන සංඛ්‍යා වර්ධනය ආශ්‍රිතව ජන සංඛ්‍යා ප්‍රමාණය මිලියන 2000 ට ළඟාවූ වර්ෂය වන්නේ,

(1) ක්‍රි.ව. 1830 (2) ක්‍රි.ව. 1925 (3) ක්‍රි.ව. 1960 (4) ක්‍රි.ව. 1800 (......)

The National e-learning Portal for The General Education

(22) කෙන්යාව හා ඉන්දියාව යන රටවල පවතින ජන සංඛ්‍යා පිරමීඩ වල ස්වභාවය දක්වෙන පිළිතුර මින් කවරක්ද?

(1)



(2)



(3)



(4)



(......)

(23) නගර හඳුනා ගැනීම සඳහා පරිපාලන මිනුම් පමණක් යොදා ගන්නා රටවල් කාණ්ඩය ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) සුඩානය, නිකරගුවා, ලිබියාව. (2) ලිතුවේනියාව, පාකිස්ථානය, සුඩානය.

(3) ලිබියාව, හයිටි, එක්සත් රාජධානිය. (4) සුඩානය, කොස්ටාරිකා, නිකරගුවා. (......)

(24) ශ්‍රී ලංකාවේ සැලසුම් ගත ජනාවාස සම්බන්ධයෙන් පොකුරු ජනාවාස ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ මින් කවරක් සම්බන්ධයෙන් ද?

(1) ගල් ඔය ආශ්‍රිත ජනාවාස වලය. (2) මහවැලි ජනාවාසකරණය යටතේ ය.

(3) දැදුරු ඔය ව්‍යාපෘතිය මඟිනි. (4) ගොවි ජනපද ව්‍යාපෘතිය ආශ්‍රිතවය. (......)

(25) නාගරික කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාවේ සකස් කරන ලද ජාතික භෞතික ව්‍යුහ සැලැස්මේ අඩංගු දකුණු පළාත් මහා නාගරික කලාපයෙහි කේන්ද්‍ර වී ඇති ප්‍රධාන නගරය වන්නේ,

(1) ගාල්ල (2) මාතර (3) කතරගම (4) හම්බන්තොට (......)

(26) හරිත විප්ලවයේ ආරම්භය සිදුවූයේ,

(1) 1943 මෙක්සිකෝවේ දී ය. (2) 1953 ජපානයේ දී ය.

(3) 1943 චීනයේ දී ය. (4) 1950 මෙක්සිකෝවේ දී ය.
(......)

(27) ජාන තාක්ෂණය මඟින් සුවිශේෂී අර්තාපල් වර්ග නිපදවීම ද කැපී පෙනේ. මේ සඳහා ආරම්භයේ සිටම දායක වූ නිෂ්පාදනායතනය වූයේ,

(1) ලීමා හි පිහිටි අර්තාපල් නිෂ්පාදන මධ්‍යස්ථානයයි.

(2) ලීමා හි පිහිටි ජාත්‍යන්තර අර්තාපල් පර්යේෂණ මධ්‍යස්ථානයයි.

(3) පීරු වල පිහිටි ජාත්‍යන්තර කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානයයි.

(4) බ්‍රසීලයේ පිහිටි ජාත්‍යන්තර කෘෂිකාර්මික මධ්‍යස්ථානයයි. (......)

(28) ලෝක මත්ස්‍ය නිෂ්පාදනය අනුව ප්‍රධාන ධීවර බිම් වලින් වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් සිදුවන්නේ මින් කවර ධීවර බිමකද?

(1) බටහිර මධ්‍යම පැසිෆික් මත්ස්‍ය බීම. (2) ඊසාන දිග අත්ලාන්තික් මත්ස්‍ය බීම.

(29) කෘෂි ද්‍රව්‍ය අලෙවිකරණය සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කවරක් ද?

(1) අලෙවිකරණ ක්‍රියාවලියේ දී වැදගත් වන්නේ සිල්ලර වෙළඳාම පමණි.

(2) භාණ්ඩ නිෂ්පාදනයේ සිට පාරිභෝජනය දක්වාම සම්බන්ධව පවතී.

(3) කෘෂි කාර්මික සංවිධාන අලෙවිකරණ ක්‍රියාවලිය කෙරෙහි බෙහෙවින් බලපායි.

(4) බහු ජාතික සමාගම් මේ සඳහා විශාල බලපෑමක් කරයි. (......)

(30) හරිත විප්ලවය යටතේ නිෂ්පාදනය කල බීජ වර්ගවල පවතින විශේෂ ගුණාංග ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) ලෙඩ රෝග හා කෘමි උවදුරු වලට ඔරොත්තුදීම.

(2) සම්ප්‍රදායික බෝග මෙන්ම අස්වනු පැවතීම.

(3) බීජ වර්ග ප්‍රමාණය අවම වීම.

(4) අස්වනු ලැබීමට දිගු කාලයක් ගත වීම. (......)

---

## II කොටස

---

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න එකකට පිළිතුරු සපයන්න.**

(01) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ 1 : 50,000 හපුතලේ භූ ලක්ෂණ සිතියමකින් කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) A-B හා C-D රේඛාවලින් දැක්වෙන බෑවුම් දක්වන්න. (ල.02)

(2) ගංගාව ආශ්‍රිතව පවතින භෞතික ලක්ෂණ 2 ක් ද, උතුරු ප්‍රදේශය ආශ්‍රිත භෞතික ලක්ෂණ 2 ක් ද හඳුනාගෙන නම් කරන්න. (ල.04)

(3) මෙහි පවතින ජල වහන රටාව කුමක්දැයි දක්වා එසේ දැක්වීමට හේතු 2 ක් සඳහන් කරන්න.(ල.03)

(4) අංක 1 හා 2 චතුරස්‍රවල වර්ගඵලය වෙන වෙනම ගණනය කරන්න. (ල.02)

(5) මෙම ප්‍රදේශයේ පවතින භූ විෂමතාවය පිළිබඳ කරුණු තුනක් කටුසටහන් උපයෝගී කරගෙන පැහැදිලි කරන්න. (ල.06)

(6) ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග අවමවීමට හේතු 2 ක් සඳහන් කරමින් භූ විෂමතාවය හා මාර්ග පහසුව පිළිබඳ කරුණු 2 ක් සඳහන් කරන්න. (ල.03)

(02) (1) 1 : 50,000 භූ ලක්ෂණ සිතියමකින් මිනිසාට ලැබෙන ප්‍රයෝජන 03ක් පහදන්න. (ල.03)

(2) ගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධති භාවිතය ප්‍රදේශයක නිවැරදි පිහිටීම දැන ගැනීමට උපකාර වන්නේ කෙසේදැයි පහදන්න. (ල.04)

(3) දුරස්ථ සංවේදනය යනු කුමක්දැයි පහදන්න. (ල.02)

(4) ගුවන් ඡායාරූපයක හා චන්ද්‍රිකා ප්‍රතිබිම්බයක පවතින වෙනස්කම් පහදන්න. (ල.05)

(5) GIS තාක්ෂණ ශිල්පීය ක්‍රම සිතියම් නිර්මාණයට හා දත්ත විශ්ලේෂණයට යොදා ගැනීමේ ඇති වාසි පරීක්ෂා කරන්න. (ල.06)

(03) (1) සංඛ්‍යාන විද්‍යාවේ දී භාවිතාවන සංගහනය හා නියැදිය අතර වෙනස දක්වන්න. (ල.04)

(2) දත්ත පිළිබඳව අර්ථ නිරූපණය සඳහා යොදා ගන්නා මිනුම් වර්ග අතර කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් 03 ක් දක්වන්න. (ල.03)

(3) ඔබ දක්වූ එක් මිණුම් වර්ගයක් භාවිතා කිරීමේ වාසි 04 ක් පහදන්න. (ල.04)

(4) පහත දැක්වෙන වර්ෂාපතන දත්ත යොදා ගනිමින් මධ්‍යස්ථය ගණනය කරන්න. (ල.05)

ඇළහැර නගරයේ මාර්තු මාසය තුළ වර්තා වූ වර්ෂාපතන දත්ත පහත දැක්වේ. (වර්ෂාපතනය mm)

| වර්ෂය | වර්ෂාපතනය |
|---|---|
| 1990 | 280 |
| 1991 | 211 |
| 1992 | 320 |
| 1993 | 180 |
| 1994 | 24 |
| 1995 | 32 |
| 1996 | 180 |
| 1997 | 181 |
| 1998 | 190 |
| 1999 | 190 |
| 2000 | 228 |
| 2001 | 230 |
| 2002 | 242 |
| 2003 | 230 |
| 2004 | 200 |
| 2005 | 305 |
| 2006 | 360 |
| 2007 | 362 |
| 2008 | 250 |
| 2009 | 121 |
| 2010 | 211 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

(5) අදාළ කාලය තුළදී ඇළහැර නගරයේ වර්ෂාපතන විචල්‍යතාව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.04)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## නව නිර්දේශය - 2016 අගෝස්තු - දෙවන වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස භෞතික භූගෝල විද්‍යාව

01 (1) පහත සඳහන් රූප සටහන මගින් පාංශු ව්‍යූහ වර්ග 4 ක් පෙන්වයි. ඒවා නිවැරදිව පිළිවෙලින් නම් කරන්න. (ල. 04)



A B C D

(2) පමක ඓන්ද්‍රිය ද්‍රව්‍ය දිරාපත් වීම කෙරෙහි බලපාන සංධක තුනක් හඳුන්වන්න.

(3) පාෂාණ ජීර්ණ ක්‍රියාවලි වර්ග තුනක් නම්කර ඒවා පිළිබඳ උදාහරණ දෙමින් විස්තර කරන්න.(ල. 04)

(4) විවිධ පාෂාණ පස බවට පරිවර්තනය වීමේ දී පසුකරන විවිධ අවස්ථාවන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 06)

02 (1) පෘථිවි පෘෂ්ඨයෙහි පවතින විභේද වර්ග 2 ක් හා භූමි වර්ග 2 ක් නම් කරන්න. (ල. 04)

(2) ආනතිය බලය මගින් විභේද නිර්මාණය වන ආකාරය රූප සටහන් මගින් පැහැදිලි කරන්න.(ල. 04)

(3) A, B හා C ලෙසින් දක්වා ඇති භූමි වර්ග තුන නම් කර ඉන් දෙකක් නිර්මාණය වන ආකාරය රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

(4) ගැටීම් හා විභේද පෘථිවි භූ දර්ශනය වෙනස් කරන ආකාරය රූප සටහන් හා උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ල. 06)

03 (1) එඩ්නා, විසුවියස්, ස්ට්‍රොට්බොලි, ෆුජියාමා හා මෞනාලෝආ, එඩ්නා යන යමහල් පවතින රටවල් නම් කරන්න. (ල. 03)

(2) ලෝකයේ යමහල් කලාප ව්‍යාප්තිය අනුව යමහල් ප්‍රධාන කලාප 3 ක් නම් කරන්න. (ල. 03)

(3) ඔබ දැක්වූ යමහල් ප්‍රදේශ ව්‍යාප්තවීම හේතු 4 ක් පැහැදිලි කරන්න. (ල. 08)

04 (1) වායුගෝලීය සාමාන්‍ය සංසරණය යන්න හඳුන්වන්න. (ල. 03)

(2) වායුගෝලීය සාමාන්‍ය සංරක්ෂණ ආශ්‍රිත ප්‍රධාන සුළං සංරක්ෂණ වර්ග තුන දක්වා ඉන් එකක රූප සටහන් ඇසුරින් ඒ ආශ්‍රිත සුළං පිළිබඳව විස්තර කරන්න. (ල. 05)

(3) කෙපන්ගේ දේශගුණික වර්ගීකරණයට අනුව දකුණු ඇමෙරිකාවේ පවතින දේශගුණ වර්ග 2 ක් නම් කරන්න. එම දේශගුණ වර්ගවල පවතින ප්‍රදේශ / වෘක්ෂලතා ස්වභාවය / දේශගුණික ලක්ෂණ ආශ්‍රිත ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල. 06)

(4) ඔබ දක්වූ දේශගුණ වර්ගවලින් එකක් තෝරාගෙන එහි පවතින මානුෂ කටයුතු පැහැදිලි කරන්න. (ල. 06)

## II කොටස මානව භූගෝල විද්‍යාව

(05) 1995 2035 දක්වා කාලය තුළ ආසියාවේ තරුණ හා වයස්ගත ජන සංඛ්‍යාවේ වර්ධන ප්‍රවණතාවය පහත රූප සටහනින් දක්වේ.



(1) තරුණ ජන සංඛ්‍යාව පිළිබඳව කැපී පෙනෙන ලක්ෂණ 03 ක් දක්වා ඊට හේතු 02 ක් ලියන්න. (ල.05)

(2) වයස්ගත ජන සංඛ්‍යාව සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණ 03 ක් දක්වන්න. (ල.03)

(3) ආසියානු රටවල සමාජ ආර්ථික සංවර්ධනයේ දී වයස්ගත ජන සංඛ්‍යා කණ්ඩායම් ආශ්‍රිතව සලකා බැලිය යුතු ගැටළු 03 ක් පරීක්ෂා කරන්න. (ල.06)

(4) ආසියානු රටවල සංවර්ධන ක්‍රියාවලි පිළිබඳ සැලසුම් සකස් කිරීමේදී අවුරුදු 15 24 ජන සංඛ්‍යා සම්බන්ධව සලකා බැලිය යුතු කරුණු 03 ක් විස්තර කරන්න. (ල.06)

(06) (1) ග්‍රාමීය ජනාවාස වල පවතින ලක්ෂණ හතරක් දක්වන්න. (ල.04)

(2) නාගරීකරණය හැර ග්‍රාමීය ජනාවාස වෙනස් වීමට බලපාන සාධක 03 ක් පැහැදිලි කරන්න. (ල.06)

(3) ගැමිරික ජනාවාස වල පහත සඳහන් අංශවල සිදුවන වෙනස්වීම් පහදන්න.

(i) ජනගහනය ආශ්‍රිත ලක්ෂණ

(ii) රැකියා ව්‍යුහය

(iii) භූමි පරිභෝග ලක්ෂණ (ල.06)

(4) ලෝකයේ නාගරික ජනාවාස ගත්විට සංවර්ධනය වෙමින් පවතින රටවල ගැටළු බහුල වෙමින් පවතින බැව් උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ල.04)

(07) (1) නාගරික හා ග්‍රාමීය ජනාවාස අතර වෙනස්කම් පහත මාතෘකා යටතේ විග්‍රහ කරන්න. (ල.06)

- ජන සංඛ්‍යාව
- භූමි පරිභෝග රටාව
- සේවා

(2) නගරය → පුරවරය → නාගරික සාමූහිකය හා නගර යාය යන අවස්ථාවන් නගර වර්ධනයට හේතුවන ආකාරය පහදන්න. (ල.08)

(3) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල ව්‍යාප්තියේ අසම බව උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ල.06)

(08) (1) වර්තමාන ලෝකයේ කෘෂිකාර්මික තාක්ෂණ ක්‍රියාවලිය වේගයෙන් ජනප්‍රිය වීමට හේතු හතරක් දක්වන්න. (ල.04)

(2) ඉහත (1) හි දැක්වූ හේතු අනුව කෘෂි තාක්ෂණය සඳහා බලපෑම් ලද අංශ දෙක පහදන්න. (ල.04)

(3) ඉහත (2) හි දක්වූ අංශ දෙකින් එකක් තෝරාගෙන ඒ ආශ්‍රිතව කෘෂි තාක්ෂණය ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කරන්න. (ල.06)

(4) කෘෂි කාර්මික තාක්ෂණය නිසා ලෝකයේ සිදුවූ පාරිසරික බලපෑම් හා වෙනත් ගැටළු 03 ක් උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ල.06)

The National e-learning Portal for The General Education